තේ තතු
ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
ISSN 1391 - 6785 වෙළුම 7 කාණ්ඩය 1 2010 ඔක්තෝම්බර්

22 FEB 2011
TEA RESEARCH INSTITUTE OF SRI LANKA
LIBRARY

අවදානම් සහිතයි எச்சரிக்கை CAUTION



# පළිබෝධනාශක බෝතලයේ ලේබලය නිවැරදිව තේරුම් ගනිමු

තේ වගාවේ වල් පැළෑටි මර්දනය සඳහා 'වල්මාරයා' වල්නාශකය මිලි ලීටර 50 ක් වතුර ලීටර 250 ක දියකර අක්කරයකට යොදන්න යැයි යම් අයෙක් උපදෙස් දුන්නොත් එය නිවැරදි උපදේශයක් ලෙස ගත හැකි නමුත්, 'වල් මාරයා' බෝතලයක් වෙළෙන්දාගෙන් මිලදී ගෙන එය භාවිතා කිරීමට පෙර දැන ගත යුතු තවත් බොහෝ දෑ තිබේ. බොහෝ දෙනෙකු ඒ පිළිබඳ ඇති නොදන්නාකම නිසා හෝ නිසි අවධානයක් යොමු නොකිරීම නිසා භාවිතා කරන පළිබෝධනාශකයන්ගෙන් නිසි ප්‍රයෝජන ගැනීමට අසමත් වනවාට අමතරව ඒ මගින් සිදු කරන පාරිසරික හානි ද අති විශාලය.

පළිබෝධනාශක බෝතලයක් හෝ පළිබෝධනාශක බහලුවක් ගෙන ආ විට පළමුවෙන්ම අප කළ යුත්තේ එහි ලේබලය හොඳින් කියවීමයි. එය කියවීමේදී අපට තේරුම් ගත නොහැකි දෑ කොපමණ තිබේදැයි ඔබට ම වැටහේවි. වචන වලින් ලියා ඇති දේ තේරුම් ගැනීමට හැකියාව ලැබුණ ද එයින් සත්‍ය ලෙසම අදහස් කරන්නේ කුමක්දැයි නිවැරදි වැටහීමක් ඔබට නැතිනම් කිසිදු ප්‍රයෝජනයක් අත් නොවේ.

අන්තර්ජාතික වශයෙන් පිළිගත් නීති රීති වලට අනුව පළිබෝධනාශක නිෂ්පාදනයක ලේබලයේ සටහන් කළ යුතු කරුණු 19 කි. එහෙත් මේ කරුණු 19 යටතේ ඇති සමහර දෑ පිළිබඳ පූර්ව දැනුමක් ඇතැයි උපකල්පනය කරමින් අපේ රටේ වෙළඳපොලට යොමු කෙරෙන සමහර නිෂ්පාදන ලේබල් වල මේ සියළු තොරතුරු සටහන් නොකෙරේ. මෙය පිළිගත හැකි තත්ත්වයක් නොවුණ ද යථාර්තය එයයි.

පහත දැක්වෙන තොරතුරු සියල්ල ලේබලයේ අඩංගු විය යුතු අතර මෙහි දැක්වෙන අනුපිළිවෙලටම අනුව සඳහන් වීම අනිවාර්ය නොවේ. සියළු තොරතුරු එක්රැස් කොට භාවිතා කරන්නාහට පහසුවෙන් කියවා තේරුම් ගත හැකි පරිදි ඉදිරිපත් කිරීමට හැකියාව තිබේ. තවත් එක් වැදගත්ම කරුණක් වන්නේ මෙම තොරතුරු සඳහන් කළ යුත්තේ පළිබෝධනාශක භාවිතා කරන වැඩි දෙනෙකු විසින් භාවිතා කරන දේශීය භාෂාවන්ගෙන් වීමයි.

1. **වෙළඳ නාමය හෝ නිෂ්පාදන නාමය**
   (trade or brand name)
   මෙය වඩාත් පැහැදිලිව පෙනෙන ලෙස සටහන් කළ යුතුය

2. **අඩංගු ද්‍රව්‍ය (ingredients)**
   මෙය ඉතා වැදගත් තොරතුරක් නිසා වෙළඳ නාමය සමගම පැහැදිලිව පෙනෙන ලෙස සඳහන් කළ යුතුය. මෙහි අඩංගු ක්‍රියාකාරී රසායන ද්‍රව්‍ය (active ingredients) ප්‍රමාණය මුළු බරෙහි ප්‍රතිශතයක් ලෙස, ලීටරයක ඇති ග්‍රෑම් ගණන, ලීටරයක ඇති මිලි ලීටර ගණන, ආදී විවිධ ආකාරවලින් සඳහන් කළ හැකිය. අඩංගු රසායනික සංයෝග නම් වශයෙන් සඳහන් කළ යුතු නැති නමුත් ඒවායේ මුළු ප්‍රමාණය සඳහන් කළ යුතුය.

3. **පොදු හෝ රසායනික නාමය**
   **(common or chemical name)**
   බොහෝ පළිබෝධනාශයකයන්හි රසායනික නාමයන් අතිශය සංකීර්ණ බවක් ගනී. උදාහරණයක් ලෙස 2-Methyle 4-D-Chloro Phenoxy Acetic Acid ලෙස රසායනිකව හැඳින්වෙන වල්නාශකයේ පොදු නම එම් සී පී ඒ (MCPA) නම් වේ. මෙම පොදු නාමය යටතේ ඇති පළිබෝධනාශකය විවිධ වෙළඳනාම යටතේ වෙළඳපොලෙහි හමුවේ.

4. **මිශ්‍රණයේ ස්වභාවය (type of formulation)**
   පළිබෝධනාශක විවිධ ආකාරයේ මිශ්‍රණ හෝ සංයෝග ලෙස නිෂ්පාදනය කරයි. මේ ද්‍රව්‍ය පරිහරණය කළ යුත්තේ විවිධ ආකාරයටය. උදාහරණයක් ලෙස තෛලෝදකාරී සාන්ද්‍රණයක් (emulsifiable concentrate) සහ ජලයේ දියවන සාන්ද්‍රණයක් (soluble concentrate) භාවිතයට ගැනීමේදී අනුගමනය කළ යුතු එකිනෙකට වෙනස් පිළිවෙත් ඇත. එම නිසා සම්මත සංකේත භාවිතා කරමින් මිශ්‍රණයේ ස්වභාවය පැහැදිලිව සටහන් කළ යුතුය.

තේ තතු
ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
ISSN 1391 - 6785 වෙළුම 7 කාණ්ඩය 1 2010 ඔක්තෝම්බර්
22 FEB 2011 TEA LIBRARY

5. **බහලුවේ අඩංගු දෑ හි ශුද්ධ බර**
**(net weight of contents of the package)**
බහලුවේ අඩංගු ද්‍රව්‍ය වල බර ප්‍රමාණයන් සම්මත ඒකකයකින් සඳහන් කළ යුතුය. උදා: ලීටර්, කිලෝ ග්‍රෑම්

6. **නිෂ්පාදකයාගේ, මිශ්‍ර කරන්නාගේ හෝ බෙදාහරින්නාගේ නම් සහ ලිපින**
මෙම තොරතුරු සඳහන් කිරීම නීතිමය වශයෙන් අනිවාර්ය කරුණකි

7. **මිනිසාට සහ සුරතල් සතුන්ට අහිතකර භාවය**
**(hazards to human and domestic animals)**
පළිබෝධනාශකයේ අඩංගු ද්‍රව්‍ය මිනිසාට හෝ ගෘහස්ත සතුන්ට අනතුරු ඇති කරන්නේද යන බව, අනතුරු ඇති විය හැකි ආකාරය සහ අනතුරු වලක්වා ගැනීම සඳහා කළ යුතු දේ පිළිබඳව සඳහන් කළ යුතුය

8. **පරිසරයට ඇති කරන අහිතකර බලපෑම්**
**(environmental hazards)**
පළිබෝධනාශකයේ අඩංගු ද්‍රව්‍ය පරිසරයට හානිදායක විය හැක්කේ කෙසේද යන්න මෙහි සඳහන් කළ යුතුය. උදාහරණයක් ලෙස "මෙහි අඩංගු ද්‍රව්‍ය මී මැස්සන්ට ඉතාමත් විෂ සහිතය" ලෙස දැක්වීමට හැකිය

9. **භෞතික හෝ රසායනික හානි**
**(physical or chemical hazards)**
පළිබෝධනාශකය මගින් සිදුවීමට ඉඩ ඇති භෞතික හෝ රසායනික හානි පැහැදිලිව සඳහන් කළ යුතුය. උදාහරණයක් ලෙස අඩංගු ද්‍රව්‍ය ගිනි ගන්නා සුළු හෝ පුපුරණසුළු නම් ඒ බව සඳහන් කළ යුතුය.

10. **අවවාදාත්මක වැකිය** **(warning or signal words)**
සෑම පළිබෝධනාශකයක ලේබලයකම 'දරුවන්ගෙන් ඈත් කර තබන්න' යන අවවාද වැකිය සඳහන් කර තැබිය යුතුය. ඊට අමතරව අඩංගු ද්‍රව්‍යයේ විෂ ප්‍රමාණය අනුව පහත සඳහන් අනතුරු හැඟවීමේ පාඨ සහ සංකේත සඳහන් කළ යුතුය.

| විෂ ප්‍රමාණය | අනතුරු හැඟවීමේ පාඨය |
|---|---|
| අධික විෂ ද්‍රව්‍ය | අනතුරුදායකය/වස |
| මධ්‍යස්ථ විෂ ද්‍රව්‍ය | අවවාදයයි |
| තරමක් විෂ ද්‍රව්‍ය | සැලකිලිමත් වන්න |
| සාපේක්ෂව විෂ රහිත ද්‍රව්‍ය | අනතුරු හැඟවීමේ පාඨ නැත |

අමතරව "අනතුරුදායකය/වස" පාඨ සමග මිනිස් හිස් කබල සහ ඇට් දෙක පෙන්වන සංකේතය භාවිතා කළ හැක.

11. **භාවිතා කිරීමට උපදෙස්** **(directions for use)**
ලේබලයේ සඳහන් තොරතුරු අතරින් වඩාත්ම වැදගත් කරුණකි. පළිබෝධනාශකය මගින් පාලනය කෙරෙන පළිබෝධයන්, භාවිතා කරන ප්‍රමාණය, ආකාරය, අවස්ථාව සහ කාලය පිළිබඳ තොරතුරු මෙහි සඳහන් කළ යුතුය.

12. **ප්‍රායෝගික ප්‍රථමාධාර ක්‍රම පිළිබඳ**
**(practical first-aid treatments)**
යම් ආකාරයකින් මෙම ද්‍රව්‍ය විෂ වීමක් සිදු වුවහොත් ක්ෂණිකව ගත යුතු ප්‍රථමාධාර පිළිබඳව සටහන් කළ යුතුය.

13. **නැවත ඇතුළුවීමේ ප්‍රකාශය** **(re-entry statement)**
පළිබෝධනාශකය යම් ක්ෂේත්‍රයකට හෝ වෙනත් කටයුත්තක් සඳහා භාවිතා කිරීමෙන් පසු ඒවා යෙදූ ස්ථානයට ආරක්ෂක ඇඳුම් පැළඳුම් නැතිව ඇතුළු විය හැක්කේ කොපමන දිනකට පසු දැයි සඳහන් කළ යුතුය.

14. **ගබඩා කිරීම සහ බැහැර ලීම** **(storage and disposal)**
ගබඩා කිරීම සහ බැහැරලීම කළ යුතු ආකාරය සහ හිස් පළිබෝධනාශක බඳුන් ඉවත් කළ යුතු ආකාරය පිළිබඳ තොරතුරු මෙහි සඳහන් කළ යුතුය.

15. **ලියාපදිංචිය හෝ බලපත්‍ර අංකය**
**(registration or licence number)**
මෙය ද නීතිමය අවශ්‍යතාවකි

16. **වගකීම් පිළිබඳ සහතිකය** **(warranty statement)**
නිෂ්පාදකයා හෝ බෙදාහරින්නා විසින් මෙම නිෂ්පාදනයේ වගකීම දරන කාලසීමාව සහ අනෙකුත් තත්තවයන් පිළිබඳ සහ නිෂ්පාදනය කල් ඉකුත් වන දිනය මේ යටතේ සඳහන් කළ යුතුය.

17. **භාවිතා නොකල යුතු අවස්ථා සහ තත්ත්ව**
**(misuse statements)**
මෙම පළිබෝධනාශක පරිහරණය නොකළ යුතු විශේෂ භෝග හෝ විශේෂ අවස්ථා ඇත්නම් මේ යටතේ ඒවා සඳහන් කළ යුතුය.

18. **භාවිතා කරන්නේ කුමන පළිබෝධයන්ට ද යන වග**
**(use area)**
මේ යටතේ මෙම පළිබෝධනාශකය භාවිතා කළ හැක්කේ කුමන භෝග, සතුන් හෝ වෙනත් ක්ෂේත්‍රයන් ට එරෙහිව ද යන්න සඳහන් කළ යුතුවේ. වෙනත් ස්ථානයක මේ විස්තර සඳහන් වී ඇත්නම් නැවත සඳහන් කිරීම අවශ්‍ය නොවේ.

19. **අස්වනු නෙළීම පිළිබඳ තොරතුරු** **(harvesting statement)**
පළිබෝධනාශකය යෙදීමෙන් පසු නැවත අස්වනු නෙළීමක් සිදු කළ යුත්තේ දින කීයකට පසු දැයි මෙහි සඳහන් කළ යුතුය. මෙය පෙර අස්වනු විරාමය (PHI) ලෙස හැඳින්වේ.